## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය - 2013

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 05 දරන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතන පනතේ 24 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයේ මුලු ඉන්ධන වියදම, සේවා අංශ 03 අතර අනුමත ප්‍රතිශතයකට බෙදාහැර ගිණුම්ගත කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද එම ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ලී බඩු හා උපකරණවල ක්ෂය රු.656,365 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අමාත්‍යාංශය සතු වාහන 03 ක් සඳහා දරා තිබුණු රු.275,033 ක ඉන්ධන වියදම ආයතනයේ ඉන්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

කෘෂිකර්ම අමාත්‍යාංශයට සම්මන්ත්‍රණශාලා පහසුකම් දිගින් දිගටම සළසා තිබූ නමුත් , 2012 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 37,950 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ ගිණුම් 04 ක ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛණවල ශේෂයන් සමඟ සැසඳීමේදී රු.594,069 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) අංක 2004/පුස/01 හා 2004 ජනවාරි 26 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | |

| | | |
|---|---|---|
| (i) | 3.1 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල ද්‍රව්‍ය සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ii) | 3.2 ඡේදය | පුස්තකාල ද්‍රව්‍ය භාරකාරත්වය පැවරී ඇති කෙනෙකු ස්ථාන මාරුවීම් ලබා යන විට හා විශ්‍රාම යාමට මාස තුනකට පෙර සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද හිටපු පුස්තකාලාධිපතිනිය 2013 මැයි 21 දින විශ්‍රාම ගොස් තිබුණද සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.14,160,647 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,157,210 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,996,563 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය වශයෙන් හා භාණ්ඩ වශයෙන් විවිධ පාර්ශවයන්ගෙන් වූ ලැබීම් ප්‍රාග්ධන සංචිත ලෙස ගිණුම්ගතකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.40,700,838 ක් විය. මෙම ප්‍රදාන වලින් ජනිත වූ වත්කම් හා එහි වටිනාකම නිශ්චිතව හඳුනාගැනීමට කටයුතුකර නොතිබූ අතර, ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 28 ක් , 2012 වර්ෂයේ ව්‍යාපෘති 14 ක් , 2011 වර්ෂයේ ව්‍යාපෘති 02 ක් ඇතුලුව ව්‍යාපෘති 44 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 43 ක් අවසන් කර තිබුණු බව දක්වා තිබුණද, එම පර්යේෂණ වලට අදාළ වාර්තා 25 ක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට ආරක්ෂක සේවා සපයමින් සිටි ආරක්ෂක සේවා ආයතනයෙහි ගිවිසුම් කාලය ඉක්මයාමෙන් අනතුරුව තවත් මාස 22 ක කාලයකට සේවා දිගුවක් ලබාදී තිබුණි. එම කාලසීමාව අවසානයේ ආයතනයේ කණිෂ්ඨ සේවකයින් 18 දෙනෙකුට රු.110,400 ක වැටුපක් ගෙවා අවිධිමත් ලෙස එක් මාසයක ආරක්ෂණ කටයුතු ආවරණය කරගෙන තිබුණි.

(ආ) හිටපු අධ්‍යක්ෂවරයා වෙත ලබා දී තිබූ රු. 92,090 ක් වටිනා කැමරාවක් හා ඩොංගලයක් ආයතනය වෙත ආපසු භාර දී නොතිබුණි.

### 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

(අ) අනුමත කාර්යය මණ්ඩලය 235 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 164 ක් වූයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 30 ක් විය.

(ආ) ආයතනයේ ලේඛකාධිකාරි තනතුර 2011 ජනවාරි 03 සිට විගණන දිනය වූ 2014 මැයි 31 දක්වා වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ අයවැය පුරෝකථනයන් හා තථ්‍ය අගයන් අතර විචලනය සියයට 27 සිට සියයට 347 දක්වා පරාසයක් තුළ විහිදී තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෝක ආහාර ව්‍යාපෘතියට අයත් වාහනයක් 2011 වර්ෂයේ ආයතනයට ලබා දී තිබූ වාහනයේ නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.

(ආ) 2006 ආයතනයේ සේවය කරන නිලධාරීන් දෙදෙනෙක් සඳහා වසර 02 ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ආයතනය විසින් අනුමත කර තිබූ අතර, ඔවුන් අධ්‍යයන කටයුතු නිසි ලෙස සම්පූර්ණ නොකිරීම හේතුවෙන් අධ්‍යයන කාලසීමාව 2013 නොවැම්බර් 30 දින දක්වා දීර්ඝ කිරීමට සිදුවී තිබුණි. ඒ සඳහා නව ඇපකරයක් අත්සන් කලයුතු බව 2013 අගෝස්තු 15 දිනැති සහකාර ලේඛකාධිකාරි (වැඩසටහන්) ගේ ලිපියෙන් දන්වා තිබුණද , 2013 දෙසැම්බර් 31 දින වන විටද ශිෂ්‍යත්වලාභීන් නව ඇපකරයක් අත්සන් කර හෝ අධ්‍යයන කටයුතු අවසන්කර හෝ නොතිබුණි.

(ඇ) විදේශ විශ්වවිද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරු ගිවිසුම් කඩකළ ශිෂ්‍යත්වලාභීන් 05 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 10,651,222 ක් විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) මූල්‍ය පරිපාලනය
(ආ) පර්යේෂණ ව්‍යාපෘති
(ඇ) වත්කම් පරිපාලනය
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය